**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

## ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

## තනතුරු පුරප්පාඩු

**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ පහත තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| | |
|---|---|
| තනතුර | : **පර්යේෂණ විශ්ලේෂක (පුරප්පාඩු 01)** |
| මාසික දීමනාව | : **මූලික වැටුප රු.53,150.00+ජීවන වියදම් දීමනාව රු.7,800.00 = රු. 60,950.00** |
| අධ්‍යාපන සුදුසුකම් | : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/ සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ ආරක්ෂක අධ්‍යයනය/ බුද්ධි සේවා අධ්‍යයනය/ ත්‍රස්තවාදය/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව/ නීතිය/ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| පළපුරුද්ද | : පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් සහිත වීම. |
| වයස | : අවු. 21ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුයි. |
| බඳවා ගැනීමේ ක්‍රමය | : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. |

- සියලුම අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේදී ඉංග්‍රීසි භාෂා හැකියාව මැන බැලීම සඳහා විනාඩි 30 ක ලිඛිත පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.

- ඉහත තනතුරුවලට අදාල සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් තම අයදුම්පත් **2022.02.28** දිනට හෝ ඊට ප්‍රථම **ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය, බිම් මහල, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි.

වැඩිදුර විස්තර සඳහා **www.defence.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**ලේකම්,**
**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**
**බිම් මහල**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය**
**ශ්‍රී ජයවර්ධනපුර**
**කෝට්ටේ**